**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව - 2018**
**--------------------------------------------------------------**

**1.1 මතය**
**-------**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**-------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳව නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදු වන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියකාර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය - (02) ඡේදය | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතව අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව ගෙවිය යුතුය. නමුත් ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් විකිරණ ආරක්ෂණ පරීක්ෂණ කටයුතු කිරීම වෙනුවෙන් අදාල නිලධාරීන්ට 2016 , 2017 වර්ෂවල දී පිළිවෙලින් රු. 70,780 ක් හා රු. 157,420 වශයෙන් එකතුව රු. 228,200 ක් ගෙවා තිබුණි. පසුගිය විගණන වාර්තාව තුලින් මෙය වාර්තා කර තිබිය දී, ඒ පිළිබඳ අවධානය යොමු නොකර සමාලෝචිත වර්ෂයේදී ද මේ ආකාරයට ම රු. 201,425 ක් ගෙවා තිබුණි. | අධ්යක්ෂ මණ්ඩල තීරණයක් අනුව මෙය ක්‍රියාත්මක කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයෙන් එම දීමනාව නතර කිරීමට මේ වන තෙක් උපදෙස් ලැබී නොමැත. එබැවින් දීමනාව ගෙවීමට කටයුතු කර ඇත. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,258,188 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,102,117 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,843,929 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු වියදම රු. 10,529,124 කින් වැඩි වුව ද ආදායම රු. 12,373,054 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 03 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2015 වර්ෂයේ දී ඌනාතාවය රු. 3,479,000 ක් ද 2016 වර්ෂයේ රු. 973,993 ක ඌනාතාවයක් වූ අතර එය 2017 වර්ෂයේ දී රු. 3,102,117 ක් විය. එය සමාලෝචිත වර්ෂයේ දී රු. 1,258,188 ක් දක්වා අඩු වී තිබුණි. බදු පෙර මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය නැවත ගැලපීමෙන් පසු නියාමන සභාවේ 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා දායකත්වය පිළිවෙලින් රු. 11,512,124 ක්, රු. 18,904,956 ක්, රු. 23,135,332 ක් සහ රු. 31,557,636 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ නිලධාරින් පස්දෙනෙක් සහනදායි පදනම මත මෝටර් බලපත්‍ර හිමිකම ලැබීමට නියමිත දිනට ආසන්න වශයෙන් වසර 01 ත් 06 ත් අතර කාලයකට පෙර පළමු බලපත්‍රය ලබා ගෙන තිබුණි. ආයතනයේ ගණන්දීමේ නිලධාරියා මුදල් රෙගුලාසි 128(1)(ජ) ප්‍රකාරව එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.<br>SC.FR.662/2010 දරන නඩුවේ දී ඇති එකඟත්වයට අනුව එය නිවැරදි බව කළමනාකරණය පැවසුව ද මෙම නඩුවේ දී පැමිණිලිකාර පාර්ශවය සමඟ මණ්ඩලය එකඟතාවයට පැමිණීමේ දී නඩුවේ වගඋත්තරකරුවන්ගේ එකඟත්වය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.<br><br>ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජයේ අයිතිවාසිකම්වලට හානිදායක නොවන ආකාරයෙන් කටයුතු කර ඇති බව විගණනයේ දී නිරීක්ෂණය නොවී ය. | පරමාණුක බලශක්ති මණ්ඩලය ද මේ අයුරින් කටයුතු කර ඇති බැවිනුත් එම නිලධාරින්ගේ බලපත්‍ර මීට පෙර අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති බැවිනුත් එපරිදි ම සභාව ද කටයුතු කර ඇත.<br><br>තවද 2010 වර්ෂයේ දී පරමාණුක ශක්ති අධිකාරියේ සේවකයෙකු විසින් ඔහුව 2006JM1-1 වැටුප් කේතයේ පිහිටුවා තැබීම සම්බන්ධයෙන් පරමාණුක ශක්ති අධිකාරියට එරෙහිව පවරා තිබූ අංක SC.FR.662/2010දරන නඩුවේ දී "පරමාණුක ශක්ති අධිකාරිය, මුදල් අමාත්‍යාංශය ඇතුළුව ආයතන කිහිපයක්ම වෙනුවෙන් පෙනී සිටින ලද නීතිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ දි ඇති කර ගත් එකඟතාවය සම්බන්ධව අප ආයතනය සෑහීමකට පත් වන | මුදල් රෙගුලාසි 128(1)(ජ) ප්‍රකාරව එය නිවැරදි කිරීමට කටයුතු කල යුතු අතර අධිකරණයේ එකඟත්වයක් ලබා ගැනීමට කටයුතු කිරීමේ දී අදාල අනුමැතියන් සහ රජයේ අයිතිවාසිකම් පිළිබඳව දැඩිව අවධානය යොමු කල යුතු ය. |

| | | |
|---|---|---|
| තව ද 2016 වර්ෂයේ දී එකඟතාවයට පැමිණි ඉහත නඩුව සහනදායි මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධව ගොනු කළ නඩුවක් නොවන අතර සභාවේ නිලධාරින්ට සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීම, මෙම නඩුවේ එකඟතාවයට පෙර සිදු වී තිබුණි. | අතර එම එකඟතාවය අනුව සහනාදායි මෝටර් රථ බලපත්‍ර ලබා දීම වැරදි නොවන බැවින් ඒ සම්බන්ධව වෙනත් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාවක් නොමැත.” | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටු නොකිරීම**<br><br>(i) පනතේ 10 (අ) වගන්තිය ප්‍රකාරව දිවයිනේ පුද්ගලික රෝහල් ආශ්‍රිතව අයනීකාරක විකිරණ සම්බන්ධිත ක්‍රියාපිළිවෙත් නියාමනය හා පාලනය සම්බන්ධව එම රෝහල් විසින් නියමිත බලපත්‍ර ලබා ගත යුතු වුවත්, දිස්ත්‍රික්ක 03 ක් තුළ පුද්ගලික රෝහල් 20 කට අදාලව සිදුකළ භෞතික නියැදි පරීක්ෂාවේ දී එසේ බලපත්‍ර ලබා නොගෙන X-කිරණ සේවා පවත්වාගෙන යන ස්ථාන 06 ක් නිරීක්ෂණය විය. | බලපත්‍ර ලබා නොගෙන x කිරණ යන්ත්‍ර පවත්වාගෙන යන ආයතන පිළිබඳ අහඹු ලෙස සිදුකරන පරික්ෂා මගින් එවැනි ආයතන 26 ක් හඳුනාගෙන නියාමනයට යටත් කිරීම සිදුකර ඇත. වෙනත් ස්ථාන වෙතොත් ඒවා හඳුනා ගැනීමට ද ඉදිරියේදී කටයුතු කරනු ඇත. නිරීක්ෂණයේ සඳහන් කර ඇති ආයතන 06 සම්බන්ධව ද අප විසින් පරීක්ෂා කර නියාමනය සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දැනුම් දෙමි. | පනතේ 10 (අ) වගන්තිය ප්‍රකාරව යෝග්‍ය පරිදි යොදා ඇති විධිවිධාන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | පනතේ 10 (ඇ) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාව විසින් අනුකූලතාවය දැක්විය යුතුයැයි නියමිත න්‍යෂ්ටික බලශක්ති ක්ෂේත්‍රයට අදාලව ජාත්‍යන්තර ප්‍රමිත සහ බැඳීම්වලට අනුකූලතාවය දක්වන බව තහවුරු කිරීම සඳහා සෝදිසි කිරීමේ වැඩසටහන්වලදී, සභාව විසින් යොදා ගනු ලබන උපකරණ, පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නිවැරදි බවට තහවුරු කිරීම සඳහා ක්‍රමාංකනය සිදු කල යුතු ය.<br><br>නමුත් සභාව සමාලෝචිත වර්ෂය තුළ විකිරණ මාත්‍රා මිතික සීඝ්‍රතාවය මැනීම සඳහා භාවිතා කරන උපකරණ 39 ක් අතුරින් 25 ක් හා විකිරණ මාත්‍රා මැනීමට යොදා ගන්නා උපකරණ 25 ක් අතුරින් උපකරණ 23 ක් ක්‍රමාංකනය කර නොතිබුණි. | බොහොමයක් උපකරණ නව උපකරණ බැවින් ක්‍රමාංකනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. මුදල් ප්‍රතිපාදනය පවත්නා ප්‍රමාණය මත ක්‍රමාංකනය කල යුතු උපකරණ ක්‍රමාංකනය කිරීමට කටයුතු කර ඇත. | සෝදිසි කිරීමේ වැඩසටහන්වලදී, සභාව විසින් යොදා ගනු ලබන උපකරණ, පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නිවැරදි බවට තහවුරු කිරීම සඳහා ක්‍රමාංකනය කල යුතුය. |
| (iii) | පනතේ 11 (ඇ) වගන්තිය ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීමේ දී ඉටු කළ යුතු කොන්දේසිවලට අනුකූලතාවය දක්වන්නේ ද යන්න තහවුරු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දැනුම් දීමකින් තොරව සෝදිසි පරීක්ෂා කිරීම් වැඩසටහන් ආයතන 26 ක කිරීමට සැලසුම් කර තිබුණ ද ඉන් ආයතන 03 ක් පමණක් පරීක්ෂා කිරීම් කර තිබුණි. ඒ අනුව | ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීම හා නව ආයතන වලට බලපත්‍ර ලබා දීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ම නිසා අතිරේක පරීක්ෂා කිරීම කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් ඉදිරි වර්ෂයේදී පරීක්ෂා කිරීම් කටයුතු කරනු ලැබේ. | මේ පනත යටතේ සාදන ලද රෙගුලාසි හෝ රීති සහ නිකුත් කල බලපත්‍රවල සඳහන් කොන්දේසි නිසිලෙස බලාත්මක කරන බව තහවුරු කිරීමට යෝග්‍ය පියවර ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | බලපත්‍ර ලබාගත් ආයතන බලපත්‍රවල අඩංගු රීතිවලට අනුකූලව කටයුතු කරනවා ද යන්න පිළිබඳ ප්‍රමාණවත් පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | | |
| (iv) | 1999 අංක 01 දරන විකිරණ ආරක්ෂක රෙගුලාසිවලට අනුකූලව සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍ර සහිත ආයතන 28 ක විකිරණ ආරක්ෂාව සඳහා භාවිතා කලයුතු තාප සංදීප්ත විකිරණමිතිකමාන (TLD) කාඩ්පත් භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | තාප සංදීප්ත විකිරණ මිතික මාන කාඩ්පත් ලබා ගැනීම සඳහා නියාමන සභාව විසින් සියළු ආයතන වෙත දැනුවත් කිරීම් සිදු කර ඇත. කෙසේ වුව ද නැවත සියළු ආයතන වෙත අවවාදාත්මක ලිපියක් යැවීමට කටයුතු කරනු ලබයි. | 1999 අංක 01 දරන විකිරණ ආරක්ෂක රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| **(ආ)** | **ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලි හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම** | | |
| | ජාතික ආපදා මෙහෙයුම් සැලැස්ම තුල න්‍යෂ්ටික හෝ විකිරණ අනතුරක දී ප්‍රතිචාර දැක්වීමේ දී හඳුනා ගනු ලැබූ ප්‍රධාන තාක්ෂණික ආයතනය වන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 58 වගන්තිය ප්‍රකාරව “ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලි හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම” සකස් කල යුතු ය. එහෙත් 2016 වර්ෂයේ සිට මෙය ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් වුව ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම සැලැස්මේ කටයුතු අවසන් කර නොතිබුණි. | ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලි හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම නියමිත කාලයට අවසන් කිරීම මෙන්ම එය ඉතා නිවැරදිව අවසන් කිරීම ඉතා වැදගත් ය. එහෙයින් අදාළ පියවරයන් සඳහා බලාපොරොත්තු වූ කාලයට වඩා වැඩි කාලයක් ගත කිරීමට ප්‍රායෝගිකව සිදු විය. කෙසේ නමුත් 2018 දෙසැම්බර් මස අග දී ආපදා කළමනාකරණ ආයතනයට මෙම සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත ය. | ජාතික න්‍යෂ්ටික හා විකිරණශීලි හදිසි අවස්ථා කළමනාකරණ සැලැස්ම සකස් කල යුතුය. |

**(ඇ) ප්‍රභවයන් ඇතුළත් ජාතික රෙජිස්ටරයක් පවත්වා ගෙන යාම**

| | | |
|---|---|---|
| ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ආයතනය මගින් ශ්‍රී ලංකාව තුළ භාවිතා වන විකිරණශීලී ද්‍රව්‍ය හා විකිරණ උපාංගවල දත්ත ඇතුලත් ලේඛනයක් පවත්වා ගැනීමට RAIS (Regulatory Authority Information System) නම් වූ මෘදුකාංගය ඇතුලත් රු. 2,138,525 ක උපකරණ පද්ධතියක් 2017 වර්ෂයේ දී පරිත්‍යාග ලෙස ලබා දී තිබුණි. බලපත්‍ර නිකුත් කර ඇති ආයතන 205 ක් සඳහා සභාව විසින් දත්ත සමුදායන් මෙම මෘදුකාංගය තුලින් පවත්වාගෙන යා යුතු ය. නමුත් 2018 වර්ෂය අවසන් වන විටත් ආයතන 30 ක දත්ත පමණක් මෙම මෘදුකාංගයේ දත්ත සමුදායට ඇතුළත් කර තිබුණි. | ආයතනයේ විද්‍යාත්මක නිලධාරින්ගේ හිඟකම නිසා හා දත්ත විශාල ප්‍රමාණයක් මෘදුකාංගයට ඇතුලත් කිරීමේ දී අධික කාලයක් වැය වන බැවින් ආයතන 30 ක දත්ත පමණක් මෙතෙක් ඇතුළත් කර ඇත. | සියළු දත්ත ඇතුලත් කර RAIS පද්ධතිය (Regulatory Authority Information System) යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම
--------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව සභාවේ කාර්යසාධනය පහත පරිදි වේ. | | |
| • රෙගුලාසි හා රීති සම්පාදනය | | |
| ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍යවල විකිරණ මට්ටම් සම්බන්ධ රීති, විකිරණ ප්‍රවේශම සම්බන්ධ නියෝග හා විකිරණ සුරක්ෂිතභාවය සම්බන්ධ නියෝග සකස් කිරීමේ කටයුතු වර්ෂය තුළ අවසන් විය යුතු වුවද මේවායේ මුල් කෙටුම්පත් පමණක් සකස් කර තිබුණි. | නිරීක්ෂණයේ දැක්වෙන කරුණු ඉදිරි වර්ෂයේදී නිම කිරීමට කටයුතු කරන බව දන්වමි. | වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් වර්ෂය තුළදී ප්‍රමාණවත් පරිදි ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |

- විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා 2018 වර්ෂය තුළ එහි අවසන් කෙටුම්පත් වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය අවසන් වන විටත් මුල් කෙටුම්පත සකස් කිරීමේ අදියරේ පැවතුණි.

## 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පරමාණුක බලශක්ති නියාමන සභාව සඳහා තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය වූ හිඟ භෞතික සම්පත් ලෙස පරිගණක 07 ක් හා නිලධාරින් හා වෙනත් ගබඩා පහසුකම් සඳහා හිඟව පවතින වර්ග අඩි 6000 ක ඉඩ ප්‍රමාණය ද සපුරා ගැනීමට 2019 පෙබරවාරි 15 විගණන දින දක්වාම සභාවට නොහැකි වී තිබුණි. | පරිගණක 07 ක් ලබා ගත්තද ප්‍රතිපාදන නොලැබීම නිසා අනිකුත් අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් සපුරා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | 2018 වර්ෂය සඳහා රු. මිලියන 48 ක් ලෙස බලපත්‍ර නිකුත් කිරීම් හා සෝදිසි පරීක්ෂා කිරීම් වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, තිරසර සංවර්ධන යටතේ සැලසුම් කර ඇති කටයුතු වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය භෞතික පහසුකම් ලබා ගැනීම සඳහා (වාහන මිලදී ගැනීම හා කුලී රථ පහසුකම්) ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් දුර බැහැර සිදුකල යුතු විකිරණ පරීක්ෂා කිරීම් කටයුතුවල ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන නොලැබීම නිසා මෙම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත. | අවශ්‍ය භෞතික පහසුකම් ප්‍රමාණවත් පරිදි සපයා ගෙන තිරසර සංවර්ධන යටතේ සැලසුම් කර ඇති කටයුතු ඉටු කර ගැනීමට ක්‍රියා කල යුතු ය. |